THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ දේශීය සමාගම
www.raigam.lk
Sri Lanka
Raigam
රයිගම් නම් කවදත් කොතැනත්
හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!
Try New Fried & Devel Cuttle
Fish Soy TVP and
New String Hopper Flour
( now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇල් වතුරෙන් අනන්න!)
Raigam – Premium Quality Food Manufacturers from Sri Lanka.
Raigam – A trusted brand for taste and uncompromised quality.
Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, Essendon, Victoria
Tel:03-9370 3813 Fax orders: 03-9337 9468
Email:sales@etechno.com.au July 2006

ඔබේ සියලුම රූපලාවණ්‍ය සහ
කොණ්ඩා මෝස්තර අවශ්‍යතා සඳහා
පහසු මිලට විශ්වාසවන්ත සේවාවක්

Studio Odel
ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ පූර්ණ සුදුසුකම්
වසර 10කට වැඩි පළපුරුද්ද
Certi II, III, IV & Diploma -
Victoria University, Australia
උඩරට පහතරට හා බටහිර ක්‍රමයට මනාලියන් හැඩ ගැන්වීම
කොණ්ඩා කැපීම - කාන්තා පිරිමි හා ළමා
බ්ලෝඩ්‍රයින් ස්ට්‍රේට්නින්
රී බොන්ඩිං පර්මින් කලරින්
ටින්ට් පොයිල් බ්ලීචින්
ඔයිල් මසාජ් සහ කොණ්ඩා සඳහා විශේෂ ප්‍රතිකාර
උත්සව සඳහා හෙයා අප් සහ හැඩ ගැන්වීම්
සියලුම අවස්ථා සඳහා මේක් අප්
මංගල ආභරණ සැපයීම
ස්ටුඩියෝ ඔඩෙල්
විමසන්න
ශිරානි
9439 0543, 0432 936 922
36 Parry Road Eltham North
Home visits can be arranged

## සරසවි කුරුටු ගීයෙන් බිඳක්



# සරසවි මතකය

සරසවි උයනේ නැවතුමෙන් කෝච්චියෙන් බැහැපු සමන් අරුනාචලම් ශාලාව පසුකර ජයතිල හෝල් එ කපැත්තට ඇවිදගෙන ගියා. අල්විස් පොන්ඩ් එක ළඟ කයිවාරුවක් දාගෙන හිටපු ගජවීර ගැන්සිය මග ඇරලා විජේවර්ධන හෝල් එක පැත්තට යන්න හිතුවේ මාලතී මග බලාගෙන ඉන්න බව දන්න නිසා. අම්ම ඔතල දුන්න බත් එක මාලතිත් එක්ක රස විඳින්න ඉඩක් ලැබෙන්නෙ නෑ ගැනිසියට අහු වුණොත්. සති තුනේ නිවාඩුව ගෙවිලා ගියේ දන්නෙම නැතිව. අම්මගේ බත් පිඟාන කොයි තරම් රසවත් වුණත් සඳගිරියෙ රෝස් පාන් කාලයි ඩයිනමයිටුයි නැතිව ඇඟට හයියක් නැතෙයි කියල සමන්ට හිතුණා. විභාගෙට තව මාස-යයි. අතඇරුණ ලෙක්චර්ස් ටිකට මාලතීගෙ පිහිට තමයි. ක්‍රෑම දාලා ක්ලාස් එකක් ගහගන්න බැරි වුණොත් රස්සාවක් හොයගෙනත් හමාරයි. සරසවි ජීවිතය කොයි තරම් කටුක වුණත් කොයි තරම් සුන්දරද කියලා සමන්ට හිතුණා. මේ බංකු වලට ගල් කණු වලට කතා කරන්න පුලුවන් නම්මොන තරම් සුන්දර වූත් කටුක වූත් අත්දැකීම් අපට කියාවිද? සරසවියේ මේස වල පුටු වල බිත්ති වල ලියවුණ කුරුටු ගී සරසවි සාහිත්‍යයක් බිහි කරන්න සමත් වෙලා. අපි ඒ ගැන ටිකක් මෙනෙහි කරමු.

එස් එස් සී විභාගෙට සම්මාන 4ක් ගන්න කකුල් දෙක වතුර බේසමේ දාගෙන මොන තරම් පාඩම් කළා ද? මට මතක් වෙනවා ඒ කාලේ දැකපු සුන්දර සිහින. උපාධි ලෝගුව බ්‍රීෆ්කේස් එක පරිපාලන මට්ටමේ රැකියාවක්. ඒත් බී ඒ උපාධිය අරගෙන එලියට ආව සහෝදර ශිෂ්‍යයො අවුරුදු ගාණක් රැකියා පෝලිමේ බලා ඉන්න බව තේරුණේ සරසවියට පය තිසබට පස්සෙ. දෙවන වසරේ සිසු සරත් අතින් මේ සංකල්පනාව සරාසවි බිත්තියක ලැයවුණේ මේ විදිහට.

එස් ඒස සී විනාසාය
සම්මානෝ අති දුර්ලභං
රැකියා විරහිතං දුක්ඛං
බීඒ ඩිග්රි මහා භයං

උදේට කැන්ටිහේ අහස පෙනෙන ඉඳිආප්ප පහයි පරිප්පු හැන්දටයි පින්සිද්ධ වෙන්න සවස් වන තුරු ක්‍රෑමක් දා ගන්න සමන්ට පුලුවන් වුණා. විභාගෙ අත ළඟටම ඇවිත්. ලෝන් එක ලැබෙන්න තව සති දෙකක්ම තියෙනවා. සමන්ගෙ හිසට වද දෙන ලොකුම ගැටලු දෙක තමයි විභාගත් බඩගින්නත්. ඔහු නොදැනුවත්වම කුරුටු ගෑවුණ මේ කවිය කොයි තරම් අව්‍යාජද?

පාඩමං අරහං තානං
විභාගං භයංකාරං
බඩගින්න ඉවසං බොලං
නින්ද නං පරමං සුඛං

නිරතුරුවම ලෙක්චර්ස් කට් කරපු ඒව ගේම තමන්ගෙ ගෑනු ළමයි එක්ක ලවර්ස්ලේන් එකේ සිරි නරඹන්න නං අමතක නොකළ සුසිරිපාල වැඩියෙන්ම බලන්න උකමැතිම දේ තමයි ප්‍රතිඵල ලේඛණය. සුසිරිපාලගේ පොත් මේසේ මේ කවිය කුරුටු ගෑවිලා තිබුණා.

ලවර්ස් ලේන් එකේ සුදු මල් පිබිදේවා
වෙනදා වගේ සවසට වැසි නොවැටේ වා
මගේ කාමරය ගණ අඳුරෙන් නොවැසේවා
ප්‍රවීණතා ප්‍රතිඵල පිට නොවේ වා

සරසවියට ඇවිත අවුරුදු දෙකක්ම ගතවුණා. කුසුම්චන්ද්‍රට තාම බැරි වුණා ගෑනු ළිමයෙක් යාලු කරගන්න. එකට ගජේ ගහන කට්ටිය ගෑනු ළමයි එක්ක ලවර්ස් ලේන් එක පැත්තට ගාටනවා දකිනකොට කුසුම් චන්ද්‍රට තමන් ගැනම දුකක් හිතෙනවා. හැබැයි නැවෙයි බෝට්ටුවයි ආපු කෙල්ලො ඔක්කොම වගේ සෙට් කරගෙන. ඉතුරු වෙලා තියෙන්නෙ තේරුණ ඒවා විතරයි. ඉවසප-න් පපුව ඊළඟ නැව එනතුරු. කුසුම්චන්ද්‍ර තමාටම කියාගත්තා.

ඉවසන දනා රුපු යුදයට ජයකොඩිය
මේ කිව් එකා ගේ කට කෑවත් මදිය
ඉක්මන් වුනු එකා ළඟ බඩු හත අට ය
බඩුවක් නොමැති මා තවමත් කොට උඩ
ය

අලව්වෙන් සරසවියට ආව සමන් ලතා කලුමකලු වුණත් හරිම හැඩකාරයි. සමන්ලතාගේ දිග කොන්ඩෙටත් නිල්පාට ඇස් වලටත් පියකරු මුහුණ ටත් ආදරය කළ ආරියරත්න ඇගේ හමේ පාටට නම් කැමති වුණේ නැහැ. තමන්ගෙ හිතේ පවතින හැඟීම ප්‍රකාශ කළේ මේ විදිහට.

සුදෝ සුදු ඔබේ කලුවන් කොන්ඩෙ සුදෝ
සුදෝ සුදු ඔබේ නිල්වන් දෙනෙත් සුදෝ
සුදෝ සුදු ඔබේ පියකරු මුහුණ සුදෝ
සුදො සුදු ඔබේ මුලු ඇඟ කලුයි සුදෝ

ආරියරත්නට සිදුවුණේ නොසිතූ අකරතැබ්බයක්. සමන්ලතා ඉන්පස්සෙ නිකමටවත් ආරියරත්න දිහා නොබලන්න ප්‍රවේශම් වුණා.

කැන්ටිමේ මේසෙ උඩ එකයෙක තියාපු පොත් ගොන්න අඩියකටත් වඩා උස ගිහින්. මාලතිත් නිමල්සිරිත් එක්ක හැමදාම පාඩම් කරන්න එන්නෙ පුරුදු මේසෙට. එක දවසකඋදෙන්ම ඇවිත් මේසෙ අල්ලගත්ත නිමල්සිරි මාලතී එනතුරු කවියක් කුරුටු ගෑවා.

එම්බා පොත් ගොන්න
මා ඔබට කෘතඥ වන්නේ
දැනුම දියුණු කළාට නොව
ඇයත් මමත් සිපගන්නා විට
ලොව කුරිරු ඇසින්
අප මුවා කළාට ය.

සරසවියට ආවේනික වුණ ලක්ෂණ දෙකක් තමයි රැවුලත් හූවත්. ඒ ලක්ෂණ දෙක ගැන දයාපාලට පහළ වුනේ අපූරු සංකල්පනාවක්.

නරියා හූ කියයි ඩිග්රිය උෟට නැත
එලුවට රැවුල ඇත වාසිටි ආවෙ නැත
මේදෙක අපට ඇත එනමුදු දැනුම නැත
සහතික මිසක් ඩිග්රිය නම් වැඩක් නැත

මදුරු පිරිස ඇඟ හැම තැන දැවටෙනවා
නෝට් පොදිය අත්තල මත වැළපෙනවා
නිදිමත දැනේ නොදැනිම නෙතු පිය වෙනවා
ඩිග්රිය ලැබෙන තුරු මේ දුක පල දෙනවා

දේශණ මොටද මතකයෙ රඳවන්න බැරි
සටහන් මොටද කියවා නිමවන්න බැරි
බුද්ධිය මොටද සත්‍යය ජය ගන්න බැරි
ඩිග්රිය මොටද රස්සාවක් ගන්න බැරි

හිතවත් තෙවෙනි වසරෙනි මේ අහපල්ලා
බැඳගත් කරත්තය හෙම්හිට ලිහපල්ලා
සෙල්ලම් කළොත් ලෙල්ලම වෙයි දැනගල්ලා
ෆයිනල් එක ළඟයි පාඩම් කරපල්ලා

ක්‍රෑම ලවර්ස් ලේන් එක ගජේ ගැහීම හූව මේ සේරටම විරාමයක්. සරසවි මෑණියන්ගෙන් සමුගත් හැමෝටම මේ දේවල් සුන්දර මතකයන් බවට පත්වෙනවා. ආයෙත් මේ දේවල් ගැන මතක් කරන්න එක වහල යට හිටපු සහෘදයන් මුණිගැහෙන මේ වගේ සුන්දර මොහොතකදි පමණයි. පේරාදෙනියේ සරසවියේ සහෘදයන් තම මවු බිමෙන් සැතපුම් දහස් ගණනක් දුරකදි වුණත් අද වගේ දවසක ඒ මතකයන් ස්මරණය කරන්න යොදා ගැනීම කොයි තරම් අගේද? මට හිතෙනවා මේ වෑයම ඊට මදක් හෝ දායක වෙන්න ඇති කියලා.

(2007 ජූලි 21 වන දින පේරාදේණිය විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්ගේ එකතුවේදී කළ මා කළ විශේෂාංගය ඇසුරිනි. මේ විශේෂාංගය සකස් කිරීමේදී සහය දුන් කුලරත්න රත්නායක නිර්මලාල් ඩයස් හා පද්මසිරි හේවාරත්න යන මහත්වරුන්ගෙන් ලද සහයට ස්තුතියි)

ශ්‍රීනාත් මද්දුමගේ

## පිණි මුතු

| | |
|---|---|
| සරසවි වරම ලැබ ඔබ සමුගෙන | ගියදා |
| සමිඳුගෙ පිහිට පැතුවා ඔබහට | දළදා |
| නෙත ගැලු කඳුළු මවගේ නෙරියේ | පිසදා |
| සෙනෙහස ලැබූවා ඇගෙ තුරුලෙහි | නොනිඳා |
| රැයේ සිනහ පා සඳ මෝදුව | නැගුනා |
| නුඹෙ රුවම කවුළුව ළඟ ළඟ | මැවුනා |
| ඔහේ ඇසල පෙරහැර යාදෙන් | සිතුනා |
| නගේ නුවර නොගොසින් කුටියෙම | රැඳුනා |
| විසිතුරුමල් උයන පිරි නෙත | දැවටේදෝ |
| බිම්මල සිනාසුණ හැඩ සිත | සැඟවේදෝ |
| සංකර තෙපුල සවනට අමරස | දේදෝ |
| වෙල්තෙර ගැයුන සීපද හීසර | වේදෝ |
| පිනිමුතු බුමුතුරුණු සිරුරම අවද | කළ |
| මදනල කියඹුවැල නුඹ මුවෙ සසල | කළ |
| පිබිදුව හැඟුම් සමයෙහි ගම අකුරු | කළ |
| මල්පල ගැනේ මතු අප පැල සදන | කල |

**පද්මසිරි හේරත්**
වෙරිබි වික්ටෝරියා

W.L. PARKER AND ASSOCIATES PTY. LTD
Registered Tax Agent & Accounting, Business & taxation Services
14 DAY TAX REFUNDS
INDIVIDUAL RETURNS
$60
ON SITE CONSULTATION AVAILABLE
CONTACT KASUN GAMLATH
0430138283
Email: kasun@wlparker.com.au
***************